ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2018 අගෝස්තු/සැප්තැම්බර්

ආර්ථික විද්‍යාව

# ECON 3130.03 – අන්තර්ජාතික වෙළෙඳ න්‍යාය

- කාලය පැය තුන (03) යි.
- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. (i) අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්භාව්‍ය න්‍යාය පූර්ව සම්භාව්‍ය මතවාදයන්ගෙන් වෙනස් වන්නේ කෙසේ දැයි සැකෙවින් පැහැදිලි කරන්න. *(ලකුණු 08)*

(ii) විවෘත ආර්ථිකයක් ඇති කුඩා රටක ශ්‍රමිකයන් 200ක් සිටින්නේ යැයි ද, ශ්‍රමය එකම නිෂ්පාදන සාධකය වන්නේ යැයි ද සිතන්න. එරට සතුව ඇති තාක්ෂණයට අනුව ආහාර ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රමික පැය 01ක් ද (ශ්‍රම පැයක නිෂ්පාදනය = 1), රෙදි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රමික පැය 03ක් ද (ශ්‍රම පැයක නිෂ්පාදනය=$^1/_3$) අවශ්‍ය වේ. දෙඅංශයේම ශ්‍රමිකයන් සමාන ප්‍රමාණයන්ගෙන් සේවා නියුක්තව ඇත.

(අ) පූර්ණ තරඟකාරීත්වය යටතේ කර්මාන්ත දෙකෙහිම ශ්‍රමිකයන්ට ශ්‍රම පැයක් සඳහා රු. 80ක් ලැබේ. ආහාර හා රෙදිවල මිල ගණන් කවරේ ද? *(ලකුණු 02)*

(ආ) ජාත්‍යන්තර වෙළඳපොළේ ආහාර ඒකකයක මිල රු. 100ක් වන අතර රෙදි ඒකකයක මිල රු. 200ක් වේ. නිදහස් වෙළඳාමට ප්‍රවිශ්ඨ වේ නම් මෙම රටට වෙළඳාමෙන් වාසි ලැබිය හැකි ද? පැහැදිලි කරන්න. *(ලකුණු 04)*

(ඇ) මෙම රට අපනයන භාණ්ඩය (ඇත්නම්) පූර්ණ විශේෂීකරණය කරයි නම් උපරිම වශයෙන් ලැබිය හැකි අපනයන ආදායම කොපමණ ද? *(ලකුණු 02)*

02. (i) පිරිනැමුම් වක්‍රය යනු කුමක් ද? මෙය ව්‍යුත්පන්න කිරීම ප්‍රයෝජනවත් වන්නේ ඇයි? *(ලකුණු 04)*

(ii) සම්භාව්‍ය න්‍යායන්ගෙන් උපදෙස් දෙන පරිදි භාණ්ඩ පූර්ණ විශේෂීකරණයකට යොමු නොවීමට රටවල් පෙළඹෙන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 04)*

(iii) X භාණ්ඩය අපනයනය කරන හා Y භාණ්ඩය ආනයනය කරන රටක් ($P_x/P_y$) ජාත්‍යන්තර සාපේක්ෂ මිල අනුපාතයට මුහුණ දෙමින් $C_1$ සමාජ සුබසාධන මට්ටම භුක්ති විඳින්නේ යැයි සිතන්න.

(අ) ඉහත තොරතුරු ප්‍රස්ථාර සටහනක ඇඳ දක්වන්න. *(ලකුණු 02)*

(ආ) ලෝක වෙළඳපොළේ X වල මිල හදිසියේ ඉහළ යන්නේ යැයි ද, රටේ නිෂ්පාදන ධාරිතාවයේ කිසිදු වෙනසක් නොවන්නේ යැයි ද සිතන්න. රටේ නිෂ්පාදන හා පරිභෝජන මට්ටම්වලට කුමක් සිදු වේද? *(ලකුණු 03)*

(ඇ) "රටක අපනයන මිල ගණන් ඉහළ යන විට ඉහළ සුබසාධන මට්ටමක් ළඟා කර ගැනීමට අපනයන ප්‍රමාණය ඉහළ නංවා ගත යුතු ය." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වේද? ඉහත ප්‍රස්ථාර සටහන ඇසුරින් පැහැදිලි කරන්න.

*(ලකුණු 03)*

03. (i) සාධක මිල සමානතා න්‍යාය යනු කුමක් ද? (ලකුණු 04)

(ii) රටක අපනයන හා ආනයන භාණ්ඩවල සාපේක්ෂ මිල අනුපාතය සාධක උරුමතාවය හා සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 06)

(iii) ජාත්‍යන්තර වෙළඳාම හරහා රටක ආදායම් ව්‍යාප්තියට ඇති වන බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. (i) ලියොන්තීෆ් පරස්පරය යනු කුමක් ද? (ලකුණු 04)

(ii) වැඩෙන පරිමාණානුකූල ඵල යටතේ රටකට ජාත්‍යන්තර වෙළඳාමෙන් ලැබිය හැකි වාසි කෙටියෙන් පහදන්න. (ලකුණු 06)

(iii) "රටවල් අතර සිදුවන තාක්ෂණයේ ගලා යාම් එම රටවල්වල වෙළඳ දිශාව වෙනස් කිරීමට හේතු වේ." ඔබ එකඟ වේද? පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. (i) රටක ඇති වන "වෙළඳාම පිණිස වර්ධනය" ඔබ අර්ථ දක්වන්නේ කෙසේ ද? (ලකුණු 04)

(ii) ශ්‍රම සූක්ෂම භාණ්ඩ අපනයනය කරන කුඩා රටක් තුළ ශ්‍රමයේ ඇති වන වර්ධනයක් එරට වෙළඳාම හා සුබසාධනය කෙරෙහි බලපාන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) X භාණ්ඩය ආනයනය කරන හා Y භාණ්ඩය අපනයනය කරන රටක් තාක්ෂණයේ වර්ධනය හරහා ආර්ථික වර්ධනය ළඟා කරගැනීමට උත්සාහ දරයි. එරට වෙළඳ ගිණුමේ හිඟයක් පවතින අතර එම පරතරය අඩු කර ගැනීමට රට උත්සාහ දරයි නම්, තාක්ෂණයේ දියුණුව යොමු විය යුතු දිශාව පිළිබඳව ඔබට දිය හැකි උපදේශය කුමක් ද? ප්‍රස්ථාර යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. (i) සඵල ආරක්ෂණ අනුපාතය යනු කුමක් ද? (ලකුණු 04)

(ii) ආනයන තීරු බදු හා ආනයන සලාකනය අතර වෙනස සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) "වත්මන් ලෝක වෙළඳාම තුළ ආරක්ෂණ ප්‍රතිපත්ති ලෙස තීරු බදුවලට වඩා තීරු බදු නොවන බාධක දෙසට රටවල් යොමුවීමේ නැඹුරුතාවයන් පවතී." මෙම ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 06)

07. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න. (එක් කොටසකට ලකුණු 04 බැගිනි.)

(i) ජාත්‍යන්තර වෙළඳාමේ පොදු සමතුලිතය
(ii) තීරු බදු සම්බන්ධ ස්ටෝල්පර් සැමුවෙල්සන් න්‍යාය
(iii) අන්තර් කර්මාන්ත සහ අන්තඃ කර්මාන්ත වෙළඳාම සඳහා පදනම
(iv) දුගී බව වැඩි කරන ආර්ථික වර්ධනය

***********